සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
**Sabaragamuwa Provincial Department of Education**

දෙවන වාර පරීක්ෂණය 2018 — 11 ශ්‍රේණිය
முதலாம் தவணைப் பரீட்சை 2018 — தரம் 11
**Scond Term Test 2018 — Grade 11**

ඉතිහාසය I — පැය එකයි
**History I — One hour**

**සැලකිය යුතුයි:-**

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 80 ක් හිමිවේ.
- අංක 1-40 තෙක් ප්‍රශ්නවලට දී ඇති 1, 2, 3, 4 පිළිතුරු අතරින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.

---

(01) ශ්‍රී ලංකාවේ දේශීය සාහිත්‍ය මූලාශ්‍ර අතර ශාසන ඉතිහාසය පිළිබඳ ලියවී ඇති මූලාශ්‍රය වන්නේ,

1. දීප වංශය 2. නිකාය සංග්‍රහය 3. මහා වංශය 4. රාජාවලිය

(02) විදේශීය සාහිත්‍ය මූලාශ්‍ර අතර ශ්‍රී ලංකාවට පැමිණ මෙහි ඇති තතු දැක බලා තොරතුරු ඇතුලත් කළ ග්‍රන්ථය කුමක්ද?

1. රිබෙයිරෝගේ ලංකාව පිළිබඳ ග්‍රන්ථය
2. ඇරිස්ටෝටල්ගේ ඩිමුන්ඩෝ
3. ජලිනිගේ නැචුරාලිස් හිස්ටොරියා
4. හියුංසාං හිමිගේ වාර්තාව

(03) පහත රට තෙක් කලාපීය ප්‍රාග් ඓතිහාසික එළිමහන් වාසස්ථානයකි.

1. මිනිහාගල්කන්ද 2. සීගිරියේ පොතාන
3. බෙල්ලන්බැඩි පැලැස්ස 4. කුරුවිට බටදොඹලෙන

(04) ක්‍රිස්තු වර්ෂයෙන් පළමුවන සියවසේ අග භාගයේදී කිරිඳි ඔය හරස් කොට තිස්සමහාරාම වැව ඉදිකළ රජතුමා,

1. ගජබාහු රජතුමා 2. අභය නාග රජතුමා
3. කුටකණ්ණ අභය රජතුමා 4. ඉළනාග රජතුමා

(05) පැරණි බෞද්ධ විහාරයක දානය සපයා ගැනීමේ කටයුතු වලදී පැන නැගුණු ගැටලුවක් **දස ගම්** ඇත්තන් විසින් විසඳූ බව සඳහන් සෙල්ලිපිය.

1. කළුදියපොකුණ සෙල්ලිපිය 2. මිහින්තලා පුවරු ලිපිය
3. බදුලු ටැම් ලිපිය 4. සංඛපාල සෙල්ලිපිය

(06) ඓතිහාසික මූලාශ්‍ර වල සඳහන් පරිදි තමන්ගේ දසවෙනි රාජ වර්ෂයේදී දිවයිනේ ග්‍රාම සීමා සටන් සිදු කිරීම කළ රජතුමා කවරුන්ද?

1. දුටුගැමුණු රජතුමා 2. පණ්ඩුකාභය රජතුමා
3. දේවානම් පියතිස්ස රජතුමා 4. වසභ රජතුමා

(07) දුටුගැමුණු රජුගේ කාර්යයන් අතරට නොගැලපෙන පිළිතුර තෝරන්න.

1. සංවිධානාත්මක සටන් ව්‍යාපාරයකට නායකත්වය.
2. පරුමක වරුන්ගේ සහය ලබාගෙන දේශපාලන බලය මධ්‍යගත කිරීම
3. දිස්ත්‍රික්කවලට බෙදා පාලන කටයුතු ගෙන යාම
4. පළමුවන වරට දිවයින එක්සේසත් කොට ඒකීය පාලනයක් ගෙන යාම

(08) ඓතිහාසික මූලාශ්‍ර වල සඳහන් පරිදි පළමු වරට මේ රටේ විශාල වැව් ඉදිකිරීමට පුරෝගාමී වූයේ.

1. ඉළනාග රජුය 2. වසභ රජුය 3. අභය රජුය 4. ධාතුසේන රජුය

(09) ක්‍රිස්තු වර්ෂයෙන් නව වන සියවසේ ලියවුනු සෙල්ලිපිවල එක්තැන් සමිය යන යෙදුම භාවිත කර ඇත්තේ,

1. ව්‍යවස්ථාදායක හැඳින්වීමට 2. විධායකය හැඳින්වීමට
3. ව්‍යවස්ථාදායකය හා විදායකය හැඳින්වීමට 4. අධිකරණය හැඳින්වීමට

(10) හතරවන කාශ්‍යප රජතුමාගේ පාලන කාලයේදී පැතිරී ගිය උණ රෝගයකට ප්‍රතිකාර කිරීම සඳහා ඉදිකරන ලද විශේෂ රෝහල මින් කුමක්ද?

1. පසවන්නිනාම ශාලා 2. වෙජ්ජසාලා
3. සිවිකා ශාලා 4. උපසග්ග රෝගනාස

(11) පැරණි කාලයේ මෙරට විවිධ කර්මාන්ත ක්ෂේත්‍රවල නියුක්ත වූ ශිල්පීන් A තීරයෙන් දැක්වෙන අතර B තීරයේ එම කර්මාන්ත පහත දැක්වේ. A හා B තීර ගැලපූ විට නිවැරදි පිළිතුර තෝරන්න.

| A | B |
|---|---|
| කබර | A නූල් කැටීම |
| දයීක | B චිත්‍ර ඇඳීම |
| තතවය | C යකඩ වැඩ |
| චිතකර | D ඇත්දත් කැටයම් |

1. A B C D 2. C D A B 3. B C D A 4. D A B C

(12) මෙරට පැරණි බදු නීතිය යටතේ රජුට අයත් ඉඩම්වල වගා කිරීම වෙනුවෙන් ගෙවන ලද බද්ද හැඳින්වූයේ,

1. මතරමජිබක 2. දකපති
3. බොජකපති 4. කෙටුකනබ

(13) දිග මැනීමටද පැරණි කාලයේ ක්‍රමවත් මිම් පද්ධතියක් භාවිතයේ පැවතිනි. එහි කුඩාම ඒකකය කුමක්ද?

1. වියත 2. ආංගුලය
3. ගව්ව 4. පරමානුව

(14) අපරාධ නීතිය සම්බන්ධයෙන්ද අපේ රජවරු දැඩිව කටයුතු කළ බවට සැලකිය යුතු විස්තරයක් හමුවන හතරවන මිහිඳු රජුගේ සෙල්ලිපිය වන්නේ,

1. වේවැල් කැටිය සෙල්ලිපිය 2. වෙස්සගිරි සෙල්ලිපිය
3. මිහින්තලා පුවරු ලිපිය 4. හෝපිටිගමුව සෙල්ලිපිය

(15) සාලිය කුමරුගේ බිරිඳ වූ අශෝක මාලා දුටුගැමුණු රජුගේ මාළිගයේ දී රසවත් ආහාර පිළියෙල කොට සිත් දිනාගත් බව සඳහන් මූලාශ්‍රය කුමක්ද?

1. දම්පියා අටුවා ගැටපදය 2. රසවාහිනිය
3. සද්ධර්මාලංකාරය 4. සද්ධර්මරත්නාවලිය

(16) ක්‍රිස්තු පූර්ව 700-450 අතර කාලවකවානුවේ ඉතාමත් සිත්ගන්නා සුළු ගෙල මාලයක් හමු වූ පැරණි සොහොන කුමක්ද?

1. බෙරගල
2. යටිගල්පොත්ත
3. රංචාමඩම
4. ඉබ්බන්කටුව

(17) පරිසරය ආරක්ෂා කිරීමේ නීතිය යටතේ උස් ගොඩ ඉඩම්වල කැලෑ නොකැපිය යුතු බවට නියෝග කර අනුරාධපුර පුවරු ලිපිය පිහිටුවන ලද රජු වන්නේ,

1. හතරවන මිහිදු රජතුමා
2. තුන්වන උදය රජතුමා
3. පස්වන කාශ්‍යප රජතුමා
4. පස්වන මිහිඳු රජතුමා

(18) පොළොන්නරුව රාජධානිය ක්‍රමයෙන් පරිහානිය කරා යාමට හා අවසානයේ බිඳ වැටීමට තුඩුදුන් හේතුවක් නොවන්නේ,

1. දුර්වල පාලකයින් බලයට පත්වීම
2. ශක්තිමත් මධ්‍යගත පාලනය
3. කාලිංග හා පාණ්ඩ්‍ය වංශිකයන් අතර බල අරගලය
4. ආර්ථික පරිහානිය

(19) කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත යන උපාධි නාමයෙන් පිදුම් ලැබූ දෙවන පරාක්‍රමබාහු රජතුමාගේ රාජධානිය කුමක්ද?

1. යාපහුව
2. කුරුණෑගල
3. ගම්පොල
4. දඹදෙනිය

(20) ඓතිහාසික සිදුවීම් කිහිපයක් පහත දක්වේ.

A. පන්සිය පනස් ජාතක පොත සිංහලයට පරිවර්තනය කිරීම.

B. ක්‍රි.ව. 1247 දී චන්ද්‍රභානු නම් ජාවක ආක්‍රමනිකයෙක් විශාල හමුදාවක් සමග මෙරටට ගොඩ බැසීම.

C. සපුමල් කුමාරයා යටතේ හමුදාව යවා යාපනය ජය ගැනීම.

D. ඉබන් බතුතා නම් ආරාබි සංචාරකයා ක්‍රි.ව. 1344 දී යාපනයට පැමිණීම

1. A B C D
2. B A D C
3. B A D C
4. C B D A

(21) යාපන රාජධානියේ ආරම්භක රජතුමා වන්නේ,

1. විජය කුලංකෛ රජු
2. වරෝදය රජු
3. සංකිලි රජු
4. කුලශේකර රජු

(22) දෙවන නාගරීකරණයේදී අභ්‍යන්තර වෙළදාම සම්බන්ධ කඩ වීදි තිබූ බව සඳහන් වන මූලාශ්‍රය කුමක්ද?

1. මහා වංශය
2. කුරුණෑගල විස්තරය
3. විසුද්ධි මාර්ගය
4. දඹදෙනි කතිකාවත

(23) පළමු වන විමලධර්ම සූරිය රජු බලයට පත්වීමත් සමග මුහුණ දුන් අභියෝගයක් නොවන්නේ,

1. නීතියානුකූල රාජ්‍ය උරුමයක් නොමැති වීම.
2. පරිහානියට පත් බුදු සසුන නගා සිටුවිය යුතු වීම.
3. උඩරට රාජ්‍ය සීතාවක බලපෑමෙන් මුදාගත යුතු වීම.
4. ලන්දේසි බලපෑමෙන් උඩරට නිදහස් කරගනී.

(24) අ තීරුවේ සඳහන් බදු වර්ග ආ තීරුව හා ගලපා නිවැරදි පිළිතුර තෝරන්න.

| අ | ආ |
|---|---|
| කුරුවෙ බද්ද | A. වලං තැනීම |
| රදා බද්ද | B. ප්‍රවාහන කටයුතු |
| බඩහැල බද්ද | C. අලි ඇතුන් අදාල |
| මඩිගෙ බද්ද | D. රෙදි සේදීම |

1. C D A B  2. C D B A  3. B D A C  4. B A D C

- **පහත සඳහන් වගුවේ A සිට C දක්වා තොරතුරු ඇසුරෙන් 25 සහ 26 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

| වර්ෂය | සටනේ නම | සිංහල රජතුමා | පෘතුගීසි නායකයා |
|---|---|---|---|
| A 1594 | D. ගන්නොරුව | G. පළමුවන විමලධර්මසූරිය රජු | J. දියෝගුද මෙලෝ කැස්ත්‍රෝ |
| B 1630 | E. රන්දෙනිවල | H. සෙනරත් රජු | K. ජෙරෝ ලොපෙස්දසුසා |
| C 1638 | F. දන්තුරේ | I. දෙවන රාජසිංහ රජු | L. කොන්තන්තීනුදසා |

(25) උඩරට රාජ්‍ය සම්බන්ධයෙන් පෘතුගීසීන් කළ දන්තුරේ සටන සම්බන්ධ තොරතුරු ඇතුළත් පිළිතුර වන්නේ,

1. A G K F  2. A F G K  3. A E K G  4. B F G K

(26) ක්‍රි.ව. 1638 දී උඩරට සම්බන්ධව පෘතුගීසීන් කළ සටන සම්බන්ධ තොරතුරු ඇතුළත් පිළිතුර කුමක්ද?

1. C D G F  2. E H G F  3. C G D F  4. C D F G

(27) 19 වන සියවස හා 20 වන සියවස මුල් දශක කිහිපය තුලදී කාර්මික ක්ෂේත්‍රයේ අති විශාල ආර්ථික දියුණුවක් උදාකරගත් ආසියාතික රට වූයේ.

1. කාම්බෝජය  2. ජපානය  3. ඉන්දුනීසියාව 4. තායිලන්තය

කාර්මික විප්ලවය නිසා සිදු වූ වෙනස්කම් කිහිපයක් පහත දැක්වේ.

A. ජනතාවට දැරිය හැකි මිලකට භාණ්ඩ සිලයට ලබා ගැනීමට හැකි වීම.
B. පන්ති සහිත සමාජයක් බිහි විය
C. බද්ධ ව්‍යාපාර සමාගම් ආරම්භ විය
D. නගරවලට ඔරොත්තු නොදෙන තරමට ජනාකීර්ණ වීම.
E. ධනපතීන් හා කම්කරුවන් අතර ගැටුම් ඇති වී වෘත්තීය සංගම් බිහි විය.

**පහත ප්‍රශ්නවලට පිළිතුරු සඳහා A B C D E අක්ෂර වලින් දැක්වෙන තොරතුරු අදාල කර ගනිමින් පිළිතුරු සපයන්න.**

(28) ඉහත වෙනස්කම් අතුරෙන් දේශපාලන ක්ෂේත්‍රය හා සම්බන්ධ වූයේ,

1. A හා E  2. B හා E  3. A හා B  4. E හා D

(29) ඉහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් සමාජ ක්ෂේත්‍රය හා සම්බද්ධ ප්‍රකාශ ඇතුලත් පිළිතුර කුමක්ද?

1. B හා C  2. A හා C  3. B හා E  4. A හා D

(30) ක්‍රි.ව. 1800 දී පමණ වන විට ගුවා හෝ පොහොර විශේෂයක් මූලිකව නිෂ්පාදනය කළ රට වන්නේ,

1. ඉන්දියාව  2. දකුණු අප්‍රිකාව  3. ඇලෙක්සැන්ඩ්‍රියාව  4. ඔස්ට්‍රියාව

(31) 1664 වර්සයේදී පොණ්ඩිචෙරි, කරිකාල්, චන්ද්‍රනගර් ආදී ඉන්දියාවේ ප්‍රදේශවල වෙළඳ මධ්‍යස්ථාන පිහිටුවා ගත් ජාතිකයන් කවුද?

1. බ්‍රිතාන්‍යයන්  2. ප්‍රංශ ජාතිකයන්  3. පෘතුගීසීන්  4. ජර්මන් ජාතිකයන්

(32) 1848 දෙවන නිදහස් සටනට නායකත්වය දුන් සටන්කාමීන් අතරින් දඹුලු විහාරයට නායක ස්වාමීන් වහන්සේගේ සහය ඇතිව රජු වශයෙන් අභිෂේක කළ පාලකයා කවුරුන්ද?

1. වීර පුරන් අප්පු | 2. හගුරන්කෙත ඩිංගිරාල
3. බූටෑවේ රටේරාල | 4. ගොන්ගාලේගොඩ බංඩා

(33) වර්ෂ 1818 නිදහස් සටනින් පසු උඩරට රාජ්‍යයේ බ්‍රිතාන්‍ය බලය පිහිටුවීම සම්පූර්ණත්වයට පත්වූ නිල ලේඛනය හඳුන්වනු ලබන්නේ මින් කුමන නමකින්ද?

1. 1818 නොවැම්බර් ප්‍රකාශය | 2. 1833 කෝල්බෲක් ප්‍රකාශය
3. 1815 උඩරට ගිවිසුම | 4. මැකලම් වාර්තාව

(34) බ්‍රිතාන්‍යයන් විසින් උතුරු හා නැගෙනහිර ප්‍රදේශ සංවිධානාත්මක මිෂනාරී අධ්‍යයන ක්‍රමයක් ගොඩනැගූ මිෂනාරී සමාගම වූයේ කුමක්ද?

1. ලන්ඩන් මිෂනාරී සමාගම | 2. චර්ච් මිෂනාරී සමාගම
3. වෙස්ලියන් මිෂනාරී සමාගම | 4. ඇමරිකන් මිෂනාරී සමාගම

**පහත A සිට E දක්වා තොරතුරු ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A ලක්මිණි පහණ | B ලංකා නිධානය
C සරසවි සඳරැස | D උදය භානු
E මාසික තෑග්ග

(35) ඉහත දැක්වෙන තොරතුරු ඇසුරෙන් බෞද්ධ ප්‍රකාශය දැක්වෙන පිළිතුර කුමක්ද?

1. C හා D 2. A හා B 3. A හා C 4. C හා B

(36) ඉහත දැක්වෙන තොරතුරු ඇසුරෙන් ක්‍රිස්තියානි ප්‍රකාශ ඇතුලත් පිළිතුර වන්නේ කුමක්ද?

1. C හා A 2. B හා E 3. A හා B 4. D හා E

(37) 1915 මුස්ලිම් අරගලයේදී සිංහල නායකයන් සමග සහයෝගයෙන් කටයුතු කල ජන නායකයා වන්නේ,

1. ආරුමුගම් නාවලර්තුමා | 2. පොන්නම්බලම් අරුනාචලම් මහතා
3. පොන්නම්බලම් රාමනාදන් මහතා | 4. ඇම්.සී. සිද්දි ලෙබ්බේ මහතා

(38) ආබාධිත බ්‍රිතාන්‍ය සොල්දාදුවකුට ආධාර පිනිස ක්‍රියාත්මක කළ පොපිමල් ව්‍යාපාරයට එරෙහිව මෙරට වාමාංශිකයන් විසින් ආරම්භ කල සංවිධානය වූයේ කුමක්ද?

1. ලංකා සංගමය | 2. සූරියමල් ව්‍යාපාරය
3. රාජ්‍ය මන්ත්‍රන සභාව | 4. ලංකා ජාතික සංගමය

(39) ශ්‍රී ලංකාවට ප්‍රථමයෙන්ම පලාත්බද නියෝජන ක්‍රමය හඳුන්වා දුන් ප්‍රතිසංස්කරණය වන්නේ කුමක්ද?

1. මැනිං - ඩෙවොන්ෂයර් ප්‍රතිසංස්කරණ | 2. කෲ මැකලම් ප්‍රතිසංස්කරණ
3. ඩොනමෝර් ප්‍රතිසංස්කරණ | 4. මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ

(40) පහත A තීරුවේ ශ්‍රී ලංකාවේ සිදු වූ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ කිහිපයක් සඳහන් වන අතර B තීරුවේ එම ආණ්ඩුක්‍රමවල කැපී පෙනෙන ලක්ෂණ දැක්වේ.

| A තීරුව | B තීරුව |
|---|---|
| i. කෝල්බෲක් ප්‍රතිසංස්කරණ | A. සර්වජන ඡන්දබලය |
| ii. මැනිං ඩෙවොන්ෂයර් ප්‍රතිසංස්කරණ | B. ව්‍යවස්ථාදායක හා විධායක සභා පිහිටුවීම |
| iii. ඩොනමෝර් ප්‍රතිසංස්කරණ | C. මහජන ඡන්දයෙන් පත්වූ පිරිස ව්‍යවස්ථාදායක සභාවේ බහුතරයක් වීම |
| iv. කෲ මැකලම් ප්‍රතිසංස්කරණ | D. ව්‍යවස්ථාදායක සභාවට ප්‍රථම වරට සීමිත ඡන්දයෙන් මන්ත්‍රීන් තෝරා ගැනීම |

1. B C A D 2. A C D B 3. B C D A 4. A B C D

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
**Sabaragamuwa Provincial Department of Education**

දෙවන වාර පරීක්ෂණය 2018 | 11 ශ්‍රේණිය
முதலாம் தவணைப் பரீட்சை 2018 | தரம் 11
**Scond Term Test 2018** | **Grade 11**

ඉතිහාසය II | පැය තුනයි
**History II** | **Three hours**

සැලකිය යුතුයි:
- I කොටසේ පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.
- II කොටසින් ප්‍රශ්න 4 කට ද III කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 06 කි.

---

## I කොටස

(01) (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල සපයා ඇති ලෝක සිතියම් කොටසෙහිද ලකුණු කර නම් කරන්න.

(i) කලා ඔය, සලාවත්තොට, යෝධ වැව, පාහියංගල, අනුරාධපුරය, නල්ලූර්, ලංකා පටුන, හුරුළු වැව, සෙංකඩගල, ගෝඨ පබ්බත (ගොඩවාය) මහියංගනය. (ලකුණු 12)

(ii) රෝමය, ඇලෙක්සැන්ඩ්‍රියාව, බතාවිය, බ්‍රිතාන්‍ය දූපත්, සිංදු ගඟ, සුභපැත්මේ තුඩුව (ලකුණු 06)

(ආ) පහත A B C D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ පුද්ගලයින් කවුරුන්දැයි අනුපිළිවෙලින් ලියන්න.

A. ශ්‍රී ලංකාවේ තානාපතිවරයෙකු රෝමයට ගොස් වීදුරු පබළු ගෙන ආ කාලයේ දී මෙරට පාලනය කළ රජතුමා.

B. ගම්පොල රාජ්‍ය සමයේදී මෙරට ආක්‍රමණය කළ චීන සේනාධිපතියා.

C. ශ්‍රී ලංකාවේ ප්‍රථම බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරයා

D. රජු රටවැසියාට ඊශ්වරයෙකු බව දක්වෙන දඹුලු විහාරයේ සෙල්ලිපියක සඳහන් රජතුමා.

- **පහත A හා B යටතේ දක්වා ඇති පිංතූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

(ඉ) (i) A පිංතූරයෙන් දක්වෙන පුද්ගලයාගේ නම කුමක්ද?

(ii) මෙතුමා පාලනය කළ ඓතිහාසික නගරය කුමක්ද?

(iii) මෙතුමා විසින් මෙරටින් පාලවාහරින ලද විදේශීය ජාතිය කවුරුන්ද?

(iv) මෙම පිංතූරය අඳින ලද්දේ කවරෙකු විසින්ද?



(ඊ) (i) B වලින් දැක්වෙන නිර්මාණයේ නම කුමක්ද?

(ii) මෙම නිර්මාණය භාවිත වූයේ කුමන කර්මාන්තයක් සඳහාද?

(iii) මෙම නිර්මාණය බිහි වූ රාජ්‍ය කුමක්ද?

(iv) මෙම නිර්මාණය සිදුකළ පුද්ගලයා කවරෙක්ද?



## II කොටස

(02) (i) ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ තෙත් කලාපයේ ලෙන් තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) පහත සඳහන් ජනාවාස හා සම්බන්ධ වෘත්තිකයින් පිළිවෙලින් නම් කරන්න.

අ. ගෝපාලගාම ඇ. කේවට්ටගාම

ආ. කසීකාරගාම ඉ. මනිකාරගාම (ලකුණු 04)

(iii) පූර්ව ඓතිහාසික යුගයේ ජනාවාසවලට ස්වභාවය කරුණු දෙකක් උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(iv) මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යුහය හා ස්වරූපය කරුණු තුනක් ඔස්සේ පැහැදිලි කරන්න. (ලකුණු 06)

(03) (i) දේශපාලන බලය මධ්‍යගත වීමේදී විවිධ රාජ්‍යත්ව සංකල්ප බිහිවිය. එසේ බිහිවූ රාජ්‍යත්ව සංකල්ප තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) ශ්‍රී ලංකාවේ රාජ්‍ය උරුමය ලැබෙන ආකාර දෙක සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) මෙරට පාලනය කළ ශ්‍රේෂ්ඨ රජවරු දෙදෙනෙකු වන දුටුගැමුණු හා වසභ රජවරුන්ගේ සේවාවන් පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) මෙරට පැරණි සාමාජයේ ආර්ථිකය කරුණු තුනක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(04) (i) පහත සඳහන් වැව් කරවන ලද රජවරුන් කවුරුන්දැයි අනුපිළිවෙළින් ලියා දක්වන්න. (ලකුණු 03)

A- මින්නේරිය වැව

B- බසවක්කුලම වැව

C- කලා වැව

(ii) අපේ රටේ පැරණි ජනයා ජලය රැක ගැනීම සඳහා යොදාගත් උපක්‍රම දෙකක් සඳහන් කරන්න.

(ලකුණු 04)

(iii) ශ්‍රී ලංකාවේ පුරාණ යකඩ නිස්සාරණ තාක්ෂණය ඉතා දියුණු මට්ටමක පැවති බව කරුණු දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) ඓතිහාසික යුගයේ මෙරට සමාජ සංවිධානය සැකසී තිබූ ආකාරය කරුණු තුනක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(05) (i) ශ්‍රී ලංකාවේ පළමුවන නාගරීකරණ යුගයට අයත් පාලන මධ්‍යස්ථාන දෙකක් ද, දෙවන නාගරීකරණ යුගයට අයත් පාලන මධ්‍යස්ථාන එකක්ද නම් කරන්න. (ලකුණු 03)

(ii) පළමුවන නාගරීකරණ යුගයට අයත් අවසන් පාලන මධ්‍යස්ථානය බිඳ වැටීමට හේතු වූ කරුණු 4 ක් ලියා දක්වන්න. (ලකුණු 04)

(iii) ශ්‍රී ලංකාවේ දෙවන නාගරීකරණ මධ්‍යස්ථාන වශයෙන් තෙත් කලාපීය ස්ථානයක් තෝරා ගැනීමට පදනම් වූ කරුණු දෙකක විස්තර කරන්න. (ලකුණු 05)

(iv) මෙරට පාලනය කළ ශ්‍රේෂ්ඨතම පාලකයෙකු වශයෙන් දෙවන පරාක්‍රමබාහු රජතුමා ඉටුකළ කාර්යය කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(06) (i) පෘතුගීසීන්ගේ රැකවරණ ලැබූ පහත සඳහන් අය භෞතිස්ම ලැබීමෙන් පසුව හැදින්වූ නම් පිළිවෙලින් ලියා දක්වන්න. (ලකුණු 03)

A. කුසුමාන දේවිය

B. යමසිංහ බණ්ඩාර

C. කොනප්පු බණ්ඩාර

(ii) උඩරට රාජධානියේ වැරදිකරුවන්ට ලබාදුන් දඬුවම් 4 ක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) පළමුවන විමලධර්මසූරිය රජතුමා විසින් ඉටුකළ ආගමික, ආර්ථික හා පෘතුගීසීන්ගෙන් උඩරට රාජ්‍යය බේරා ගැනීමට අනුගමනය කළ පියවරයන් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) මහනුවර රාජධානියේ සමාජ සංවිධානය සකස්ව තිබූ ආකාරය උදාහරණ තුනක් සහිතව විස්තර කරන්න. (ලකුණු 06)

(07) (i) විදේශ ආධිපත්‍යයෙන් ශ්‍රී ලංකාව මුදවා ගැනීමට උඩරටියන් විසින් 1818 නිහස් සටනේ නායකයින් දෙදෙනෙකු ද, 1848 සටනේ එක් නායකයෙකුද නම් කරන්න. (ලකුණු 03)

(ii) 1818 නිදහස් සටන අසාර්ථක වීමට හේතු දෙකක් ද 1848 නිදහස් සටන අසාර්ථක වීමට හේතු දෙකක් ද සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) කෝට්ටේ රාජ්‍ය පෘතුගීසීන් යටතට පත්වීමට බලපෑ හේතු 2 ක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) පෘතුගීසීන්ට හා ලන්දේසීන්ට කන්ද උඩරට රාජ්‍ය යටත් කර ගැනීමට නොහැකි වූයේ කුමක් නිසාදැයි සාධක තුනක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

## III කොටස

(08) (i) පුනරුද සමයේ සාහිත්‍ය පොත්පත් රචනා කළ එංගලන්තයේ සිටි ග්‍රන්ථ කතුවරු තිදෙනෙකු නම් කරන්න. (ලකුණු 03)

(ii) පහත ABC හා D යටතේ ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ පුද්ගලයන් කවුරුන්දැයි අනුපිළිවෙලින් ලියා දක්වන්න. (ලකුණු 04)

A- මොනාලිසා චිත්‍රය සිතුවම් කළ චිත්‍ර ශිල්පියා

B- පිලිපීන් දූපත් සොයාගත් දේශගවේෂකයා.

C- අප්‍රිකානු දකුණු තුඩුවට "කුණාටු තුඩුව" වශයෙන් නම්කළ දේශ ගවේෂකයා.

D- මුද්‍රණ යන්ත්‍රය නිපද වූ පුද්ගලයා.

(iii) ශාස්ත්‍රීය පුනරුදය යටතේ ප්‍රබෝධයක් සිදුවූ අංශ දෙකක් පැහැදිලි කරන්න.

(iv) දේශ ගවේෂණය සඳහා පුනරුදය බලපෑ ආකාරය නිදසුන් මගින් විස්තර කරන්න.

(09) (i) බ්‍රිතාන්‍යයේ කාර්මික විප්ලවය තුළ දක්නට තිබූ ප්‍රධාන කර්මාන්ත 3 කුමක්ද? (ලකුණු 03)

(ii) බ්‍රිතාන්‍ය යුරෝපයේ සෙසු රටවලට වඩා කාර්මික නිෂ්පාදන ක්ෂේත්‍රයේ ඉදිරියට පැමිණීමට බලපාන ලද කරුණු 04 ක් සදහන් කරන්න. (ලකුණු 04)

(iii) කාර්මික විප්ලවයට සමගාමීව කෘෂි ක්ෂේත්‍රයෙහි ද විශාල වර්ධනයක් සිදුවිය. කරුණු 2 ක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) කාර්මීකරණයේ අහිතකර ප්‍රතිඵල තුනක් නිදසුන් දක්වමින් විස්තර කරන්න. (ලකුණු 06)

01. (අ) කොටසට පිළිතුරු ලිවීම සඳහා යොදා ගන්න.



01. (ආ) කොටසට පිළිතුරු ලිවීම සඳහා යොදා ගන්න.

